

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **55 වන කාණ්ඩය** | **බු.ව. 2556 වෙසක් මස පුරපසළොස්වකදා ක්‍රි.ව. 2012 මැයි මස 05 වන දා** | **01 වන කලබ** |

# පිළිවෙත් පුරමින් බුදු හිමි පුදමු

දෙ දහස් හයසිය වසරෙක් සපිරේ
සිදුහත් බෝසත් හිමි බුදු බව ලැබ
පේ වෙමු අපි ඒ මහ පුද උලෙළට
පුදමු අපේ බුදු සමිඳුන් ගරු කොට

දිවි හිමියෙන් අපි පන්සිල් සුරකිමු
මෙත් කුලුණින් සව් සතුනට සළකමු
මනු ගුණ දම් නිරතුරු ව උදුළවමු
පිළිවෙත් පුරමින් තිසරණ අදහමු

**අනඳ**



# වෙසක් දින කෙසේ ගත කළ යුතු ද?

වජිරාරාමාධිපතිව වැඩ විසූ
**අතිපූජ්‍ය නාරද මා හිමිපාණන් වහන්සේ විසිනි**

"බෞද්ධ ළමයා" වෙසක් දින උදේ 5 ට ප්‍රීති මුහුණින් නැගිටියි. නැගිට කෙණෙහි ම "නමෝ බුද්ධාය"යි බුදු පියාණන් වහන්සේට නමස්කාර කෙරෙයි. ඉක්බිති "සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා"යි දස වරක් මෙත් වඩා "හැම දෙන හට සුබ වෙසක් මඟුලක් වේවා" යි පතයි. යමකු සමඟ අමනාපයක් ඇති වී නම් බුදු පියාණන් වහන්සේ වෙනුවෙන් එය හැර දමයි.

"මීට පසු මම අද අටසිල් සමාදන් වෙමි" යි ඉටා මුහුණ කට හොඳින් සෝදා සුදු වතක් පෙරෙවැ ආදරණීය මව් පිය දෙදෙනා ගේ ප්‍රේමණීය පා මුල වැටී දොහොත් මුදුනේ තබා ගෞරවයෙන් වඳියි. වැඩි මලුන් ද එසේ ම වඳියි.

දැන් පින්වත් දරුවා වෙසක් මඟුලට සැරසෙයි. නවගුණ වැළක් කර ලා අතින් මල්ගෙන සිනහ මුහුණින් යුතු ව ප්‍රීති සිතකින් සතුටු ව සිල්වත් සඟ නමක් මෙන් මව් පියන් හා වැඩි හිටියන් සමඟ සන්සුන් ව ගමේ ආරාමය කරා පැමිණෙයි. අනෙක් සිල් පිරිසත් සමඟ පසඟ පිහිටුවා හිඳ තේරුම් දැන ගෙන හොඳින් අට සිල් සමාදන් වෙයි.

සිල්වත් බෞද්ධ ළමයා දුන් මලින් හා සුවඳින් බුදුන් පුදයි. සෑය වඳියි. බෝධිය වඳියි. සඟුන් වඳියි. වැඳ නිමවා මඳ වේලාවක් භාවනා කොට ලොවට සෙතක් වනු පිණිස ජීවිතය රැක ගනු සඳහා ආහාර වළඳයි.

ඊට පසු වුව මනා නැති කථා නො කොට නිකරුණේ කාලය ගත කෙරෙමින් බණ අසමින් දහම් පොත් බලමින් භාවනා කෙරෙමින් ධර්ම සාකච්ඡා කෙරෙමින් ප්‍රයෝජනවත් ලෙස ඉතා ප්‍රීතියෙන් දවස ගත කෙරෙයි.

බුදු පියාණන් වහන්සේ වෙනුවෙන් සිල් රකිමින් පිරිසිදු ළමයකු වී පසු දින වෙසක් සැරැසිලි කෙරෙමින්, නරඹමින්, තවත් ප්‍රීති වෙයි.

සුබ වෙසක් මඟුලක් වේවා !



සත්පුරුෂයෝ දුර සිටියාහු වුවත් හිමාලය පර්වතය මෙන් පෙනෙත්, අසත්පුරුෂයෝ ළඟ සිටියාහු වුව ද රෑ විදි ඊතල මෙන් නො පෙනෙත්.

ධම්මපදය - ප්‍රකීර්ණක වර්ගය



# අමෘත භවනයට ආශංසන

**(බෞද්ධ ළමයා බු.ව. 2481 (1937) වෙසක් කලාපයෙනි)**

සියලු දෙනහට ම සුබ වෙසක් මඟුලක් වේවා යි අතිශය දයායෙන් ආශංසනය කෙරෙමින් අපි අද ඉතා ආදරයෙන් මේ ධර්ම භාණ්ඩාගාරය ධර්මද්වීපවාසී පින්වත් දරුවන් අතැ තබමු.

මෙහි හැම වචනයක් ම කරුණායෙන් හා මෛත්‍රියෙන් ලියන ලද්දේ ය. මෙය ලබන්නා වූ පින්වත් දරුවෝ සැනැසෙත් වා ! පින්වත් දරුවෝ තමන් ලත් සඟරාව තම සොහොයුරු සොහොයුරීනට ද, අසල්වාසීනට ද, නෑ මිතුරනට ද දී ඔව්හු දු සනසත් වා !

අද හැම සිතක් ම සතුටින් පිරේ වා ! හැම ගෙයකට ම ශාන්තිය වේවා ! සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා ! හැම රටවල ම ආරෝග්‍ය ශාලාවල ඉන්නා සියලු රෝගීහු අද තෙරුවන් බෙලෙන් සුවපත් වෙත්වා ! හැම රටවල හිරගෙවල ඉන්නා පින්වත්හු ද අද සුවපත් වෙත්වා ! මේ ධර්මද්වීපයේ හිර ගෙවල ඉන්නා හැම පින්වත්හු අද තිසරණ සරණ ගොස් සිල් සමාදන් ව පරම සුඛය ම ලබන්නට සැරැසෙත්වා ! හිරගෙයි සිට සිල් රක්නාහු ඒකාන්තයෙන් ම දෙව් ලෝ යන්නාහ.

මේ කලියුගයේ රත්රන් දරුවෝ නම් ධර්මද්වීපවාසී අප ගේ උතුම් දරුවෝ ය. පින්වත් දරුවන් දවසින් දවස ගුණ දහමින් වඩ වඩාත් දියුණුවනු දක්මට අපි ඉතා කැමැත්තෙමු. පින්වත් දරුවන් දවසින් දවස වඩ වඩාත් සුවපත්වනු දක්මට ද අපි ඉතා කැමැත්තෙමු. එ හෙයින් ම කරුණායෙන් හා මෛත්‍රියෙන් මේ ධර්ම භාණ්ඩාගාරය පින්වත් දරුවනට දායාද කොට දෙම්හ.

බුදු පියාණන් වහන්සේ ඉපිද වදාළ සේක් උතුම් වූ ලුම්බිනී සල් වෙනෙහි ය. සල් ගස වනාහි එක දවසින් රියන් සියයක් වැඩී සුපුෂ්පිත වන්නේ ය. යහපත් ධර්මද්වීප වාසීනුදු එක දවසින් රියන් සියයක් වැඩී සුපුෂ්පිත වන්නා වූ සල් ගස සේ අද ම සියලු ගුණයෙන් පිරෙනු දක්මට අපි කැමැත්තෙමු.

ධර්මද්වීප වාසීන්ගේ දියුණුව සව්සතුන් ගේ සුවය සඳහා ය. අවුරුදු දෙදහසකට පමණ පෙර රෝමයට ගොස් අපරිහානීය ධර්මයන්ගේ අනුසස් වර්ණනා කළාහුත් ධර්මද්වීප වාසීහු ය. අවුරුදු එක්දහස් පන්සියයකට පමණ පෙර ජීවිතයෙහි පවා ආශා අත් හැර මහසයුර එතෙර කොට චීනයට වැඩම කොට එහි භික්ෂුණී ශාසනය පිහිටුවා එ රටට දහම් වැසි වැස්සවූවෝත් සිංහල භික්ෂුණීන් වහන්සේ ම ය. අවුරුදු එක් දහස් තුන් සියයකට පමණ පෙර කාශ්මීර දේශයට ගොස් වැව් කැණීමට එරට වාසීනට උගන්වා එ රට සුභික්ෂ කළාහුත් ධර්මද්වීප වාසීහු ම ය. දඹදිව මහා ධර්මදූතාශ්‍රමයක් පිහිටුවා කාශ්මීර ගන්ධාර වංග චීන යන ආදි රටවලට අමෘත දානය කළාහු ද ධර්මද්වීපයේ බොධිසිරි මාතාවෝ ය.

අද වනාහි ධර්මද්වීපවාසීහු පෙර තමන් තුන්ලොවට කළ ශාන්තිය සිහි කොට වඩාත් විර්යාරම්භ කරන්නාහ.

මේ පින්වත් ධර්මද්වීපවාසීන් තුළ කිසි දුක් ගැනවිල්ලක් නැත්තේ ය. අපගේ ධර්මද්වීපවාසීහු කිසිවකු හට කිසි චෝදනාවක් නො කෙරෙති. ලෝක වාසීනට වඩ වඩාත් වැඩ කිරීමට ම ප්‍රාර්ථනා කෙරෙති. පින්වත් ලෝක වාසීනට මේ ධර්මද්වීපවාසීන් ගේ පපුව වුවමනා නම් බුදු බව පතන්නා වූ යහපත් ධර්මද්වීපවාසීහු අතිශය සොම්නස්ව තම ඉල ඇට ඉවත් කොට කරුණා කිරෙන් හා මෛත්‍රී මී පැණියෙන් පිරී උතුරන්නා වූ තම පපුව ගලවා ලෝකවාසීනට දෙන්නා හ.

මේ ධර්මද්වීපයේ නැවැත ගාමිණී රජතුමා වැනි මහා වීරයන් ඇතිවිය හැකි ය. පරාක්‍රම රජතුමා වැනි මහා වීරයන් ඇති විය හැකි ය. හිස ගලවා දුගියාට දුන් සිරිසඟබෝ රජතුමා වැනි මහා වීරයන් ඇති විය හැකි ය.

අපගේ ද්වීප ශාස්තෘ වූ මිහිඳු මහ රහතන් වහන්සේ ගැන මිහින්තලා ශිලා ලිපියෙක මෙසේ සඳහන් වේ.

**"ගෞරවාර්හ ආචාර්යෝත්තමයාණන් ගේ නියමයෙන්, පිය මහ රජාණන් ගේ ආරාධනයෙන් සිව් දෙනකුන් වහන්සේ විසින් පිරිවරන ලදුව ලෝ වැඩ පිණිස වැඩ වදාළ මහතාණන් වහන්සේ මේ භූමියෙහි සැතපෙමින් ද සිටිමින් ද, වැඩ හිඳිමින් ද, සියලු ජනයා දුකින් මුදා සුවපත් කරන සේක."**

ධර්මද්වීපවාසීහු ද ඒ මිහිඳු මාහිමියාණන් වහන්සේ අනුගමනය කෙරෙමින්, ඉර හඳ බබළන තාක් ම පවත්නා සේ සම්බුදු සස්න රකිමින් සව් සතුන් සනසමින් සුව සේ වෙසෙත් වා !

තුනුරුවනට දිවි පුදා සව් සතුන්ගේ සුවය සඳහා මහද්දයායෙන් වීර්යය වඩන්නා වූ යාපත් බෞද්ධයනට ද "බුද්ධ" යි කියති. එ හෙයින් බුදු පියාණන් වහන්සේ සරණ ගිය තිස්පන් ලක්‍ෂයක් බෞද්ධයෝ තිස්පන් ලක්‍ෂයක් මහා

බ්‍රහ්මයන් සේ තුන් ලෝ සනසමින් සුව සේ වෙසෙත් වා! තවද සම්බුද්ධ සූර්යයාණන් වහන්සේ ගෙන් සද්ධර්ම රශ්මි ලත් තිස්දහසක් දේදුනු සේ ශීල සමාධින් රම්‍ය වෙශීව ලොව සරහමින්, ලොව සනසමින් වෙසෙත් වා! තවද අමා මෑණියන් වහන්සේ ගෙන් අමෘතාභිෂේක ලත් ධර්මද්වීපවාසීහු මේ දිව්‍ය රාත්‍රියෙහි අමා දහරින් ලෝ තෙමන පූර්ණ චන්ද්‍රයා සේ ලොවට සදහම් වැසි වස්සවමින් වෙසෙත් වා ! තව ද ධර්මද්වීපවාසී තිස්පන් ලක්‍ෂයක් බෞද්ධයෝ ලෝකයා ගේ දුඃඛාන්ධකාරය දුරු කෙරෙමින් තිස් පන් ලක්‍ෂයක් තාරකාවන් සේ සම්බුද්ධ ශාසනාකාශයෙහි බබළත් වා !



## තුනුරුවන් වැඳීම

දාන සීල ඈ පැරුම් බෙලෙන්
සව් කෙලෙස් නසා නිවන් දුටු
ලෝ මුදුන් උතුම් බුදු රදුන්
සාදු! සාදු! මම වදිම් බැතින්

සිව් අවා දුකින් මුදා ලෙවන්
ලොව්තුරා ලොවී සැපත් දෙමින්
හිම් නැතී සෙතක් සැදූ එ දම්
සාදු! සාදු! මම වදිම් බැතින්

සාර සීල ඈ ගුණෙන් යුතු
දෙව් බඹුන් වෙතින් පිදුම් ලැබූ
පව් බිඳක් නැතී අරී සඟුන්
සාදු! සාදු! මම වදිම් බැතින්

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ**
**මහ නා හිමිපාණෝ**



# බෝසත් දරුවන් ගේ 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරුව

**"ගුරු සීයා" විසිනි**

සිදුහත් බෝසතාණන් වහන්සේ ගේ සම්බුද්ධත්වයෙන් වසර 2600 ක් සපිරෙන්නේ මෙම 2556 වෙසක් පුනු පොහෝදා ය. හෙළ බොදු දරුවෝ සම්බුදු පූජා උලෙළට සැරසෙත්වා !

බුදු හාමුදුරුවෝ දරුවන් ගේ බුදු පියාණෝ ය. දරුවන් ගේ අගය, දරුවන් හොඳින් හදා ගත්තොත් එයින් ලැබෙන මහඟු ප්‍රයෝජනය ලොවට හෙළි කළ වදාළෝ උන් වහන්සේ ය. 'පුත්තා වත්ථු මනුස්සානං' මිනිසුන්ට ඇති ඉහළ ම සම්පත (වස්තුව) නම් දරුවෝ යැයි පෙන්වා වදාළා පමණක් නොව, දරුවන් ගේ මනසත් කයත් නිසි අයුරින් සමබර ව හදන පිළිවෙත් මඟ ද උන් වහන්සේ මැනැවින් දේශනා කළහ.

අපේ පින්වත් දරුවෝ බුදු පියාණන් වහන්සේ කරුණාවෙන් හා ප්‍රඥාවෙන් මානව සමාජයේ මුදුනට ම පැමිණි උතුමාණන් බව දනිති. උන් වහන්සේ ගේ ඥාන බලය, ගුණ බලය, ධර්ම ශක්තිය, ලොව අන් කිසිදු කෙනෙකු ගේ ඥානයකින්, ගුණයකින්, බලයකින්, ධර්මයකින් යටපත් නොකළ හැකි බව අපේ දරුවෝ මැනැවින් දනිති. බුදු

බණ අසන, බුදු බණ කියවන සැදැහැති දරුවන් උදාසනින් පිබිදෙන්නේත් තුනුරුවන් ගේ ආශීර්වාදය ලබාගෙන ය. ලොවුතුරු බුදු පියාණන් ගේ මහිමය බැලුව මැනැවි. උන් වහන්සේ දිනපතා උදාසන මහා කරුණා සමාපත්තියට සමවැදී අද දින කවර නම් කෙනෙකුට පිහිටක් සලසම් දෝ කියා නුවණින් ලෝකය දෙස බලා වදාරති. පින්වත් දරුවෝ ද එලෙස තමන් ගේ මවට හෝ පියාට හෝ සහෝදර - සහෝදරී කෙනෙකුට හෝ නෑ-හිත මිතුරකුට හෝ වෙනත් පිහිටක් විය හැකි කෙනෙකුට හෝ කළ හැකි උපකාරයක් ගැන උදාසනින් ම සිතන්නට පුරුදු වෙත් වා !

පින්වත් දරුවෝ බෝසතාණන් වහන්සේ පුරුදු කළ මාර්ගයෙහි යන්නට, හොඳ වැඩ කරන්නට ඉතා කැමති ය. බෝසත් මඟ යන ගුණවත් දරුවා දන් දෙන්නට ඉතා කැමැත්තේ ය. තමාට ලැබෙන ඉතා රසවත් දෙයක් වුවත්, තවත් කවුරුන් හෝ සමඟ බෙදාගෙන අනුභව කරන්නට ඉතා කැමැති ය. අනුනට නො දී තනියෙන් කෑම කෑත පුරුද්දක් බව ඒ දරුවා දනී.

බෝසත් දරුවා සිල් සමාදන් වන්නට බලවත් කැමැත්තක් දක්වයි. නිති පන්සිල් රකින්නට ඉතා කැමැති වන දරුවා ඒ ශීලයෙන් ලබාගත් හික්මීම කථාවෙන් ද ක්‍රියාවෙන් ද පෙන්වන්නට සමත් වෙයි. හේ සැර පරුෂ වචන කථා නො කරයි. ඇත්ත කතා කරයි. බොරු නො කියයි. යහපත් වචනයෙන් යහපත් සිතිවිල්ලෙන් යහපත් ක්‍රියා ඇති ව ජීවත් වන ඒ පින්වත් දරුවා මහා භාග්‍යවන්තයෙකි. මුළු පවුලට ම ආශීර්වාදයකි. මුළු රටට ම ශාන්තියකි.

බෝසත් දරුවා කම්මැළි නැත. කළ යුතු වැඩ කල් දමන්නේ නැත. අකීකරුකම් පාන්නේ නැත. කුමාරතුංග

පඬිතුමා 'සිරිමත්' කව් පෙළ ලිව්වේ එබඳු දරුවකු ගැන ය. මේ බලන්න.

"මව්පිය සහ ගුරු
නෑදෑ සොහොවුරු
සැමට ම කීකරු
සැපතෙකි මේ දරු"

පින්වත් දරුවා වීර්ය පාරමිතාව පුරන්නෙකි. ඒ බෝසත් දරුවා "මට මේ දේ කළ නොහැකි යි" "මට බෑ" "මට අමාරුයි" කියා කිසි විටෙකත් සිතන්නේ නැත. බෝසතාණන් වහන්සේ පැරුම් දම් පිරීමට, බුදු වීමට වීර්ය කළ සැටි සිතන දරුවා ඒ වීර්යය ම වඩා වීරයකු වන්නට සිතයි. ඒ දරුවා නින්දා නො සලකයි. අපහාස නො තකයි. බාධා නො බලයි. හමුවන බාධාවලට ම බාධා ගෙන දී ඉදිරියට ම යයි. තමාට මුහුණ පාන්නට ලැබෙන හැම බාධාවක් ම තමා ගේ ජයග්‍රහණයන් මැන බලන උරගල ලෙස නුවණින් සලකයි. බෝසතුන් වහන්සේ බුදු බව ඉලක්ක කරගෙන එය අවබෝධ කරගන්නා තෙක් වීර්ය අත් නොහැර ක්‍රියා කළා සේ පින්වත් දරුවා තමා බලාපොරොත්තු වූ ඉලක්කය සපුරා ගන්නා තෙක් වීර්යයෙන් උත්සාහ කරයි.

අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඥාණ මහානායක මාහිමියන් වහන්සේ අපේ පින්වත් හොඳ දරුවන්ට ලියූ මේ කවියත් ලස්සනට ගායනා කර මතක තබාගන්න. රජ දරුවන් වන දරුවෝ කවුරු දැයි උන් වහන්සේ මෙයින් පැහැදිලි කරති

"උදයෙම නැඟිට නොමැළි ව පාඩම් කරන
ඇදහිලි ඇති ව තිසරණ පන්සිල් රකින
වැඳ මවුපියන් හට කිකරු ව දවසරින
හොඳ ළදරුවෝ රජ දරුවො ය රට රකින"

බෝසතාණන් වහන්සේ පිරූ පාරමී ගුණයනට ළං වී, හැදුණුකමින් ද, උගත් කමින් ද කුශලතාවෙන් ද බැබළි බැබැළී දියුණු වෙමින් අවුත්, හොඳින් බණ දහම් අසා ඉගෙන මේ උතුම් බුද්ධශාසනය රැකගන්නට පින්වත් දරුවෝ තරයේ වැර වඩත් වා ! අපේ රට- ජාතිය - ආගම - භාෂාව යන මේ සිවු රුවන ම රැකීම පින්වත් දරුවනට බාරයි.

පින්වත් දරුවෝ පිබිදෙත් වා ! ඉදිරියට ම යෙත් වා! බුදු පියාණන් දෙසූ උතුම් පිළිවෙත් පුරමින් ම බුදුන් පුදන්නට සැරසෙත් වා ! 2600 උතුම් සම්බුද්ධත්ව ජයන්තිය බබළවන්නෝ අපේ පින්වත් සැදැහැවත් දරුවෝ ම ය. තිසරණ සරණින් පින්වත් දරුවෝ ශාන්තිය ලබත් වා ! හැම දියුණු උදා කර ගනිත් වා !

"හොඳින් පදම් කළ හම කැමැති අතකට නමා කැමැති කටයුත්තෙක යෙදිය හැකි වන්නාක් මෙන් ද, හොඳින් උණු කොට තවා ගත් පිරිසුදු රත්රන් කැමැති උසස් කර්මාන්තයෙක යොදා ගත හැකි වන්නාක් මෙන් ද, මෘදු ගුණ ඇති ළමයා මෙලොව දියුණුවෙහි වුවත් පරලොව දියුණුවෙහි වුවත් කැමැති උසස් කටයුත්තෙක යෙදිය හැකි වේ. **එහෙයින් මෘදු ගුණ ඇති ළමයා පිරිසුදු රන්පිඬෙකි**"

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ**
**මහ නා හිමිපාණෝ**



# Sambuddhatva Jayanti!

The trees are whispering,
The flowers insinuating,
Rendering the pond with delight.
Its ripples immerse in the moonlight,
A celebration for the day that has come.

Amidst the tranquility,
Encompassed in serenity,
And endorsed with peace of mind
The cherished prince had transcended;
Blessed, Perfected, and Fully Awakened,
Emerging as the Buddha at last!

A seed has been planted, a secret found,
A noble precedent made.
The path to happiness has been unveiled:
Relinquishing life for eternal bliss.
The planted seed, now a towering tree
Canopies the world in ecstasy.
This priceless, undecaying truth,
The light of wisdom, a treasured virtue.
And accepted with everlasting reverence,
Remains supreme forevermore.

**Chathuri Wickramaratne**
Grade 10
Dhamma School,
Houston Buddhist Center, USA



# දැහැමි සමාජයකට දායක වෙමු

කොස්ගම බොල්ලතාව ශ්‍රී සුභද්‍රා දහම් පාසලේ උප ප්‍රධානාචාර්යානී
**ශාස්ත්‍රපති එච්. එම්. සුජාතා නාලිනි මහත්මිය විසිනි.**

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් සියයට 75ක් ම බෞද්ධයන් බව ඔබ අප දන්නා කරුණක්. ඒත් ඒ අය අතරින් වැඩි පිරිසක් සුසිරිත් වඩා දුසිරිතට නැඹුරුවන, පිනට වඩා පවට බරවෙන, කුසලයට වඩා අකුසලයට යොමුවන අය සේ දිනෙන් දින පරිහානිය කරා ගමන් කරන අයුරු දක්නට ලැබීම ඇත්ත වශයෙන් ම සංවේග උපදවන සුලුයි.

දුවේ, පුතේ, මේ දෙදහස් හයසිය වැනි සම්බුද්ධත්ව ජයන්තිය සමරන වර්ෂයයි. උසස් මනසකින් යුත් මිනිසා මේ ආ දිගු ගමනේ පිය සටහන් දෙස බලන විට පෙනී යන කරුණක් තමයි, ඔවුන් දිනෙන් දින දියුණුව කරා පා නැගූ පිරිසක් බව. පාෂාණ යුගයේ සිට මේ දක්වා තමන්ට අවශ්‍ය මෙවලම් එකින් එක දියුණු කරගෙන ආ ඔවුන් සම්බුදු දහමේ ආභාෂයන් සමඟ ආධ්‍යාත්මික වශයෙන් ද දියුණුව සලසා ගත්තා. ඒ බව ද අප අමතක නොකළ යුතුයි. එවන් සමාජයකට හිමිකම් කියන අප පරිහානිය කරා ගමන් කරන්නේ ඇයි?

බුදුපියාණන් වහන්සේ ශාක්‍ය ජනපදයේ නිග්‍රෝධාරාම විහාරයේ වැඩ වසන සමයක, 'මහානාම' කියන ශාක්‍ය පුත්‍රයා උන්වහන්සේ කරා එළඹ, "ස්වාමීන් වහන්ස, 'උපාසක'

කියන්නේ කාටද?" කියා ප්‍රශ්න කළා. එවිට බුදුපියාණන් වහන්සේ, යමෙක් බුදුන් සරණ ගියේ ද දහම් සරණ ගියේ ද සඟුන් සරණ ගියේ ද හෙතෙම උපාසක හෙවත් බෞද්ධයකු වන බව (**යතෝ ඛෝ මහානාම, බුද්ධං සරණං ගතෝ හෝති, ධම්මං සරණං ගතෝ හෝති, සංඝං සරණං ගතෝ හෝති, එත්තාවතා ඛො මහානාම උපාසකො හොතීති**) වදාළා. මීළඟට මහානාම රජු තවත් ප්‍රශ්නයක් ඇසුවා. ඒ තමයි, 'ස්වාමීන් වහන්ස, උපාසකයා සිල්වතෙකු වන්නේ කෙසේ ද? කියන එක. එයට පිළිතුරු දෙන බුදුපියාණන් වහන්සේ සතුන් මැරීමෙන් වළකින, (**පාණාතිපාතා පටිවිරතෝ හෝති**) නුදුන්දෙය ගැනීමෙන් වළකින (**අදින්නාදානා පටිවිරතෝ හෝති**) වැරදි කාමයෙන් වළකින (**කාමේසු මිච්ඡාචාරා පටිවිරතො හොති**) බොරු කීමෙන් වළකින (**මුසාවාදා පටිවිරතෝ හොති**) තැනැත්තා සිල්වතෙකු වන බව වදාළා.

බුදුසමිඳුන්ගේ මේ දේශනාවට අනුව බෞද්ධයා නම් සිල්වතෙකු විය යුතුයි. සිල්වතෙක් නම් මේ සිල්පද ආරක්ෂා කරන්නෙකු විය යුතුයි. මේ ශික්ෂාපද පහ (**පංච සික්ඛාපදානි**) බෞද්ධයාගේ නිත්‍ය ශීලයයි. ගිහි පැවිදි දෙපක්ෂයේ ම ලෞකික ලෝකෝත්තර දියුණුවට හේතු වන ආචාර ධර්ම පද්ධතියයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කරගත් ජීවත්වීමේ අයිතිය, පොදු හා පෞද්ගලික දේපළ භුක්ති විඳීමේ අයිතිය, ඒ වගේ ම මූලික සමාජ ඒකකය වන පවුල් ජීවිතයේ අයිතිය, ඒ වගේ ම අදහස් නිවැරැදි ව ප්‍රකාශ කිරීමේ හා දැන ගැනීමේ අයිතිය මිනිස් අයිතිවාසිකම් වශයෙන් 1948 වර්ෂයේ දී පිළිගත්තත්, දුවේ, පුතේ, බෞද්ධයන් වන අප පංචසීලය තුළින් මේ මිනිස් අයිතිවාසිකම් ස්වේච්ඡාවෙන් ම ආරක්ෂා කිරීමට ඉගෙන ගත්තේ ක්‍රි.පූ. 06 වන සියවසේ එහෙම නැත්නම් බුදුරදුන් ජීවමාන කාලයේ සිටමයි. ආචාර

ධර්ම අතින් ඒ තරම් පොහොසත් දිගු ඉතිහාසයක් ඇති අප ඇයි තවත් පිරිහෙන්නේ?

අද අප තාක්ෂණික මෙවලම්වලට හුරුවීම නිසා, හැමදෙයක් ම මුදලින් අගය කිරීමට වෙහෙස වීම නිසා අපේ සිතුම් පැතුම්, ජීවන පරමාර්ථ, ජීවන චර්යාව ආදී හැම දෙයක් ම වෙනස් කරගෙන. ඒකයි අද අප පිරිහීමට පත් වෙමින් සිටින්නේ. බුදුපියාණන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයෙන් පෙන්වා වදාළේ මිනිසා පංචසීලාදි උත්තරීතර මනුෂ්‍ය ධර්මයන්ගෙන් පිරිහෙන විට ආයු වර්ණ සැප බලයෙන් ද පිරිහෙන බවයි. නුවණින් ද පිරිහෙන ඔවුන් ලෝභ ද්වේෂ මෝහ චේතනාවන් උත්සන්න වී තිරිසනුන් මෙන් ඔවුනොවුන් ඇනකොටා ගන්නා තත්ත්වයට පත්වන බවයි.

දුවේ පුතේ, ඔබ අප වැඩුණේ බුදු දහමේ ආභාෂයෙන් බව අමතක කරන්න එපා. බෞද්ධයන් වන අප සුසිරිතට මිස දුසිරිතට නැඹුරු විය යුතු නැහැ. පිනට මිස පවට බරවිය යුතු නැහැ. කුසලයට මිස අකුසලයට බර විය යුතු නැහැ. අප උත්සාහ කළ යුත්තේ දිනෙන් දින බුදු සමයේ ඉගැන්වෙන උත්තරීතර මනුෂ්‍ය ධර්ම අපේ ජීවිතයට ළං කර ගැනීමටයි. බුද්ධ දේශනාව අනුව ජීවිතය හැඩ ගස්වා ගැනීමටයි. බුදු පියාණන් වහන්සේ දේශනා කළේ, '**සුනාථ**' හොඳින් අසන්න. '**ධාරෙථ**' අසන්න ලැබෙන උතුම් ධර්මය හොඳින් සිත්හි දරා ගන්න. '**චරථ**' ඒ අනුව කටයුතු කරන්න කියලයි.

එහෙනම් දුවේ පුතේ, බුදුන් සරණ ගිය දහම් සරණ ගිය අපි සැරියුත් මුගලන් මහාකාශ්‍යපාදි මහා සංඝ පරම්පරාවෙන් පැවැත එන මහ සඟරුවන වෙත එළඹ, උතුම් දහම් මඟ අසා දැන , අවබෝධ කොට ගෙන ඒ අනුව අපේ ජීවිතය පවත්වා ගැනීමට අදිටන් තබා ගනිමු. පළමුව කය වචන සංවර කරගත් සිල්වතකු බවට පත්ව, දස අකුසලයෙන් මිදී

දස කුසල ධර්මයට අනුව ජීවිතය හැඩ ගස්වා ගත් අවංක සමාජ පුරවැසියකු සේ, මව්පිය ගුරුවර හිතමිතුරු වැඩිහිටි කුල දේවතාවුන් වෙනුවෙන් අප අතින් ඉටුවිය යුතු සමාජ මෙහෙවර නොපිරිහෙළා ඉටු කරමු.

දුවේ පුතේ, ජීවිතය උතුම් වස්තුවක්. එය රැක ගන්න නම් අප්‍රමාදී විය යුතුයි. බුදුරදුන් දේශනා කෙළේ, '**පමාදෝ මච්චුනෝ පදං**' කියලයි. ඒ කියන්නේ ප්‍රමාදය විපතට පරිහානියට මරණයට හේතුවන බවයි. සත්ත්වයා දෙලොවින් පිරිහෙන්නේ සිතේ බැඳෙන කෙලෙස් මල නිසයි. බුදුරජාණන් වහන්සේ තෙරුවන් සරණ ගිය උපාසකයාගෙන් බලාපොරොත්තු වුණේ සිතේ බැඳෙන කෙලෙස් මල දුරු කරලා දැමීමයි. උන්වහන්සේ ඒ සඳහා උපමාවකුත් පෙන්වා වදාළා.

**"අනුපුබ්බේන මේධාවී - ථෝක ථෝකං ඛණේ ඛණේ**
**කම්මාරෝ රජතස්සේව - නිද්ධමෙ මල මත්තනො"**

රන්කරුවා රිදියෙහි මල ඉවත්කරන්න උත්සාහ කරනවා වගේ නුවණැත්තා ටිකින් ටික සිත තුළ බැඳෙන රාගාදි කෙලෙස් මල ඉවත් කර ගන්නා බවයි. ඒ ගාථාවේ අදහස.

ඉතින් දුවේ පුතේ, මේ සඳහා පෞද්ගලිකව ම ඉදිරිපත් විය යුත්තේ තමන්මයි. වෙනත් කෙනකුට තවත් කෙනකුගේ සිත පිරිසිදු කිරීම හෝ අපිරිසිදු කිරීම කළ නොහැකියි. රටක් සමාජයක් දියුණුවට හෝ පරිහාණියට පත්වන්නේ තම තමන් සුරකින ප්‍රතිපත්ති මත. අපි අපි ම මේ ගැන හොඳින් සිතා බලමු. අපේ නුගුණ දුර්වලකම් අප විසින් ම දුරුකර ගනිමු. **මිනිහා හදා රට හැදීමේ උතුම් ප්‍රතිපත්තියට** දායක වීම සඳහා 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය ඔබ අප හැම දෙනාට ම ආශීර්වාදයක් වේවා !

**හැමට තෙරුවන් සරණයි.**



# කිසා ගෝතමී

**සිරිල් හේවාවසම් කිවියාණන් විසිනි**

මිය ගිය අයට පණ දෙන්නට නො හැකි   වග
නො ම දන්නා ‘කිසා’ නො රැඳී අතර   මඟ
මළ පුතු රැගෙනැ විත් තෙමමින් නයන   යුග
වැතිරී මගේ බුදු හිමි සිරි පතුල   ළඟ

මහ වෙදැදුරාණෙනි, සව් ලෙව් සුවය   පැතු
පුබුදා දෙනු මැනැවි මගෙ මේ නිදන   පුතු
යනුවෙන් කියා වැලපෙන විට ලෙස   උමතු
බුදු හිමියන්ට වැටහුණි ඇගෙ නියම   තතු

නැගෙණිය, මට හැකි ය ඔබෙ පුතු   පුබුදන්න
හැකි නම් අබ මිටක් මෙහි ගෙනැවිත්   දෙන්න
හිමියනි ගෙනෙමි, මා එන තුරු වැඩ   ඉන්න
ඉන්නම්, නො මළ ගෙයකින් එය ගෙන   එන්න

මළ දරුවා ද කරපින්නා සිට   එතැන
දිව ගිය ‘කිසා’ අබ සෙවුමට තැන   නො තැන
නො හැකි ව එය කරන්නට - බව තතු   හැඳින
ආපසු  අවුත් බුදු හිමි ළඟ වැඳ   වැටිණ

'හිමියනි නො මළ ගෙයකින් අබ හොයන        එක
ලොවැ කිසි ජගතකුට කිසි විට නො කළ        හැක
ම-පුතු ද මළ කඳෙකි, එහි තතු සිටිමි        දැක
මට ඇති එක ම සැප , නැසුම ය සසර        දුක

නැඟෙණියය, කොහි ද තුරුලෙහි සිටි මළ        දරුවා
මා ඔහු බුදු පියේ සොහොනට විසි        කෙරුවා
බුදු හිමි එ-වර දම් දෙසුමට මුල        පිරුවා
ඇය බණ අසා පැවිදි ව සැනසුම        ලැබුවා



**චන්දෝ යථා විගතවලාහකේ නභේ**
**විරෝචති වීතමලෝ 'ව භානුමා**
**එවං'පි අංගීරස ත්වං මහාමුනි**
**අතිරෝචසි යසසා සබ්බලොකං**

**(වංගීසත්ථෙර ගාථා)**

'වලා කුළක් නැති නුබ        කුස
ලෙළී දිලෙන පුන් සඳ        ලෙස
නිමල් කැනින් ලැබූ        පහස
තෙදවත් දිනපතිඳු        විලස

මුනිඳුණෙනි, ඔබ ලෝ        කුස
බබළත් සිරුරින් කිත්        යසස



# ගුරු පියාණන් වහන්සේ ගේ පා පියුම් වැඳීම

**(බෞද්ධ ළමයා බු.ව. 2481 (1937) වෙසක් කලාපයෙනි)**

මේ උතුම් වෙසක් පෝදා ද, හැම දා ද, කළ ගුණ දන්නා කළ ගුණ සලකන පින්වත් දරුවෝ තමන්ගේ ආචාර්යෝත්තමයාණන් වහන්සේ වඳිත් වා !

**සික්ඛාපෙත්වා මමං නිච්චං**
**අභිවුද්ධිඤ්ච කාරයී**
**තං මෙ සුගරුනො පාදං**
**සබ්බදා හි නමාම්‍යහං**

යනුවෙන්

"යම් ආචාර්යෝත්තමයාණන් වහන්සේ කෙනෙක් හැම කල්හි ම අනුකම්පා පෙරදැරි ව මා හික්මවමින් සිතිනුත් කයිනුත් ගුණයෙනුත් නුවණිනුත් මෙලොවිනුත් පර ලොවිනුත් මා දියුණු කළ සේක් ද,

මම මාගේ ඒ මහා කරුණා ඇති ගුරු පියාණන් වහන්සේ ගේ පා පියුම් හැම කල්හි ම ඉතා ආදරයෙන් වඳිමියි කියා පින්වත් දරුවෝ තම ගුරුතුමාණන් වහන්සේ හට වඳිත් වා!

තවද පින්වත් දරුවෝ මෙසේ ද පතත් වා !

"අනේ මම මාගේ උතුම් ගුරු පියාණන් වහන්සේ ගේ පයේ දූවිලි වෙම්වා ! "අනේ මම මාගේ උතුම් ගුරු පියාණන් වහන්සේ ගේ පා පිස්නට පාපිස්නක් වෙම්වා ! අනේ මාගේ ගුරු පියාණන් වහන්සේ ගේ පයට පියුම් පිපේවා ! අනේ මාගේ ගුරු පියාණන් වහන්සේ තිලෝගුරු ම වන සේක් වා !

ධර්මද්වීපවාසී පින්වත් දරුවෝ අද "**ඉමාහං භන්තෙ අත්තභාවං තුම්හාකං පරිච්චජාමි**" යි කියා තමන්ගේ ජීවිතය ද තමන් විසින් සංසාරයේ දී රැස් කර ගන්නා ලද සියලු පින් ද තමන් ගේ උතුම් වූ ගුරු පියාණන් වහන්සේ හට පූජා කෙරෙත්වා !



## වෙසෙසි පින් පැවැරුම

බෞද්ධ ළමයා මෙම නව කාණ්ඩයේ පිට කවරය නිර්මාණය කැරැ දුන් ඇමරිකාවේ ටෙක්සස් ජනපදයේ හූස්ටන්හි චම්පික වික්‍රමරත්න කලාවේදියාණන් හට ද, ආරම්භයේ පටන් බෞද්ධ ළමයා සඟරාවේ මුද්‍රණ දායකත්වය ලබා දෙන සම්පත් බැංකුවට ද අපගේ කෘතඥතා පූර්වක පුණ්‍යානුමෝදනය මෙයින් හිමි කරමු.

"බෞද්ධ ළමයා" කළමනාකරු



සිරිත් මුතුහර - 01

# කෘතඥතාව හෙවත් කෙළෙහි ගුණ සැළකීම

බෞද්ධ ළමයා ගේ චරිතය, ජීවිතය බබළවනු පිණිස ගුණ රුවන් මාලාවක් පැළඳවීමේ උතුම් අදහසින් අද සිට ලිපි මාලාවක් පළ කරන්නට අපි කල්පනා කරමු. බෞද්ධ ළමයා ගේ ලස්සන වඩාත් ප්‍රකට වන්නේ, අදහස්, සිතුම් පැතුම්වලිනුත් හැඩ වැඩ වූ තරමට ය. පිරිසිදු වූ තරමට ය. ඒ සඳහා මේ ලිපි පෙළ අපේ දරුවනට වඩාත් ප්‍රයෝජනවත් වේ යයි අපි සිතමු.

බුදු පියාණන් වහන්සේ ලෝකයට පළමු වරට ඉගැන්වූ පාඩමෙන් මේ ලිපි පෙළ ආරම්භ කරමු. ඒ කුමක්දැයි අපේ පින්වත් දරුවෝ දනිති. ඒ තමයි කෙළෙහි ගුණ සැළකීම.

කෙළෙහි ගුණ සැළකීම මිනිසුන් තුළ ඇති දුර්ලභ ගුණයක් ලෙස බුදු දහමෙහි වදාරා ඇත. අපේ පින්වත් දරුවෝ ඒ දුර්ලභ ගුණය සුලභ කෙරෙත්වා !

කෘතඥතාව හෙවත් කෙළෙහි ගුණ සැළැකීම උතුම් මනුෂ්‍ය ධර්මයකි. කෙනකු තමාට සුළු වූ හෝ උපකාරයක් කළ හොත් එය මතක තබාගෙන නැවැත උපකාර කිරීම, අඩුම වශයෙන් මතක තබාගෙන ළෙන්ගතු ව ඒ උපකාරය

වෙනුවෙන් සිනහ මුසු මුහුණින් ස්තුති පූර්වක වීම කොතරම් ශ්‍රේෂ්ඨ ධර්ම ස්වභාවයක් ද?

උගත් කමින්, නිලතලවලින්, ධනයෙන්, පරිවාර සම්පත්තියෙන් ඉහළට ගිය විට, තමන් ගේ දෙමාපියවරුන්, ගුරුවරුන්, උපකාරක නෑසියන් හිත මිතුරන් අවප්‍රමාණ කොට අමතක කිරීම මහත් ම අධම (පහත්) ක්‍රියාවකි. තමන් වැඩි දියුණු වූ විට දෙමවුපියනට නොසළකන, සිප් සතර ඉගැන්වූ ගුරුවරුන් දුටු විට අහක බලාගෙන යන, ඔවුනට නම් වනම් කියා අපහාස කරන මිනිස්සු සමාජයෙහි හිඟ නො වෙති. ඔවුනට ද ඒ දුඃඛදායක අත්දැකීම කවරදා හෝ විඳින්නට සිදු වනවා ඇති.

පින්වත් දරුවෙනි, බල්ලකුට, පූසකුට, අනෙක් සතකුට කෑම ටිකක් දුන් විට, ආදරයෙන් කතා කළ විට එය හොඳින් මතක තියාගෙන ඒ සතුන් නැවත හමු වුණාම පෙන්වන ආදරය , සැලකිල්ල මඳක් සිහි කරන්න. එ බඳු වූ ගුණ ස්වභාවයක් වත් නැති දෙපා මිනිසුන් මේ මිනිස් සමාජයට කොතරම් නම් නින්දාවක් ගෙන දෙනවා දැයි මඳක් සිතා බලන්න.

සමාජයේ සිදුවන සදාචාර පරිහානිය ගැන කථා කරන නුවණැති අය සත්පුරුෂ සමාජයක් බිහි කරගැනීමට උපාය මාර්ග සොයති. කෙළෙහි ගුණ සැළැකීම සත්පුරුෂ ගුණ වැළේ මුඳුන් මල බව නිතර සිහිපත් කිරීම වටී.

කවර ගුණයක් වුව ද අපේ සිත් සතන් තුළ ඉබේ පහළ නොවේ. පින් කළ අයට නම් ස්වාභාවික ව ඒ ගුණ සම්පත්තිය පහළ වේ. එසේ නැති අය ගුණවත් වීමේ වටිනාකම් සළකාගෙන, මනුෂ්‍යත්වයට ගුණවත් වීමේ අත්‍යවශ්‍යතාව නුවණින් සිතා උත්සාහයෙන් ගුණ

දහම් දියුණු පවුණු කරගත යුතු ය. ඒ සඳහා ඉතා ඇවැසි ගුණාංගය නම් කල්‍යාණ මිත්‍ර සේවනය යි හෙවත් යහපත් මිතුරන් ඇසුරු කිරීම යි.

පින්වත් දූලා පුතාලා තම තමන් ගේ ගුණ ප්‍රමාණය දිනපතා ම නුවණින් මැන බලත් වා ! එ විට තම තමන් ගේ ඇති අඩු පාඩුකම් කැඩපතක දිස් වන්නා සේ පෙනෙන්නට පටන් ගනීවි. ඔබ කොතරම් රූසපුවෙන් බැබැළුණත් ගුණ සපුව (ගුණ සම්පත්තිය) ඔබ ළඟ නැත් නම් ඒ රූමත් කමේ වටිනාකමක් නැත.

"නැණ ගුණ දම්
රුව පැහැ තුම්
ඇති අය නම්
රෝස කුසුම්"

යනුවෙන් කුමරතුංග මුනිදාස පඬිතුමා නුවණ යි, ගුණ දහම යි, රූප සම්පත්තිය යි සියල්ල ම ඇති දරුවා රෝස කුසුමක් සේ සුවඳ දිදී බැබැළෙන්නේ යැයි සඳහන් කෙළේ ය.

අපේ පින්වත් දූ-දරුවෝ ගුණයට ම බර වෙත් වා! කරුණාවෙන් තෙත් වූ ළය ඇත්තෝ වෙත් වා ! කවුරුන් වුවත් තමන්ට කළ උපකාරය අමතක නො කරන, කෙළෙහි ගුණය මැනැවින් ම දන්නා සුපින්වත් දරුවෝ ම වෙත් වා!

පින්වත් දරුවනට තුනුරුවන් සරණින් සුබ වෙසක් මඟුලක් වේවා !



*From The DHAMMAPADA Verse 41*

# CARING FOR THE SICK
# THERA PUTIGATTA TISSA

**(Origin of Metta Sutta)**

Compiled by
**Srima Warusawithana** - Calgary, Canada

Infested with sores, oozing pus and blood
Tissa – the monk lay upon his bed,
Writhing in agony, calling for help,
But none came by to clean his wounds
Nor give him food and water to quench his thirst;
Unbearable stench emanated from his sores,
Wallowing in his own filth, cast aside by brother monks
A discarded wretched, a miserable sight he was:
The Buddha's all-pervading compassion – MahaKaruna
For those in pain, for those needing help,
Spotted the lonely, neglected Tissa
Ridden with open sores on his body.
A pot of lukewarm water, soap and other needs,
The Buddha carried to the chamber where Tissa lay;
Ananda seeing the Buddha in this act of mercy,
Followed the Lord, helping, fetching more warm water,
Bathed the monk and washed his soiled clothes,
The monks in the monastery bewildered by what they saw,
The Buddha himself caring for the sick monk,
Joined Ananda and their Master,
And together cleaned the chamber,
Made their brother monk happy and comfortable.
When all this was done, The Buddha spoke to Tissa
Words of solace and gleanings from the sublime Dhamma;
Tissa attained the final stage of sanctity – an arahatPutigattaTissa
***`He who cares for the sick, such a one truly ministers to me`***
These the Buddha`s words were, on caring for the sick.